
# 12 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ



12.1 රූපය - අන්තිම රාත්‍රි භෝජනය

ක්‍රිස්තුන් වහන්සේ මෙලොවින් සමු ගැනීමට පෙර අප හා සඳහට ම සිටිනු සඳහා මහා බ්‍රහස්පතින්ද දින අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ සේක. තව ද ඔවුන් වහන්සේ සිහි කරලනු වස් නැවත නැවත එය සිදු කරන ලෙස, තම අපෝස්තුලුවරුන්ට නියම කළ සේක. දිව්‍ය පූජාව තුළින් එම පිළිවෙත ලෝක අවසානය දක්වා අඛණ්ඩ ව සිදු කරනු ලැබෙයි. දිව්‍ය සත්ප්‍රසාදය තුළ ක්‍රිස්තුන් වහන්සේ ජීවමාන ව වැඩ සිටින සේක.

කතෝලික ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය මෙන් ම අග්‍රස්ථානය ද හිමි වනුයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ය. මන්ද යත් ජීවමාන ව ක්‍රිස්තුන් වහන්සේ එහි වැඩ සිටින නිසා ය. එහෙයින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ, **"දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය"** නමින් හඳුන්වනු ලැබෙයි. දිව්‍ය පූජාව තුළ දෙවි පියාණන් වහන්සේට යාග වෙමින්, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අපගේ ආත්මික භෝජනය වෙමින් අප ව පෝෂණය කරන සේක.

## දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ

### 1. දේව ප්‍රසාද නිධානයක්

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යනු මහ බ්‍රහස්පතින්ද දින ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින, අනගි දේව ප්‍රසාද නිධානය යි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 2. භෝජනයක්

"යමෙක් මාගේ මාංසය **අනුභව** කරන්නේ ද, මාගේ රුධිරය **පානය** කරන්නේ ද ඔහුට සදාතන ජීවනය ඇත. තව ද මම ඔහු අන්තිම දවසේ දී උත්ථාන කරන්නෙමි. මන්ද මාගේ මාංසය සැබෑ **භෝජනය** වේ; මාගේ රුධිරය සැබෑ **පානය** වේ. මාගේ මාංසය **අනුභව** කරන, මාගේ රුධිරය **පානය** කරන තැනැත්තේ මා තුළ ජීවත් වන්නේ ය; මම ද ඔහු තුළ ජීවත් වන්නෙමි" (ජොහන් 6:54-56) මෙහි දී "මාංසය" හා " රුධිරය" යනුවෙන් අදහස් කරන්නේ සක්‍රමේන්තුමය ආකාරයෙන් අපට ලැබෙන දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය යි.

## 3. යාගයක්

"උන් වහන්සේ රොටී ගෙන තුති පුද, ඒවා කඩා, ඔවුන්ට දී, "ඔබ **උදෙසා** දෙනු ලබන මාගේ ශරීරය මේ ය; මා සිහි කිරීම පිණිස මෙය කරන්නැ"යි වදාළ සේක. එලෙස ම භෝජනයෙන් පසු කුසලාන දී, මේ කුසලාන ඔබ **උදෙසා** වගුරුවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුම ය" (ලූක් 22:19-20).

## 4. ගිවිසුමක්

"එලෙස ම රාත්‍රී කෑමෙන් පසු කුසලාන ද රැගෙනඃ 'මේ කුසලාන මාගේ රුධිරයෙන් පිහිටුවන නව **ගිවිසුම** ය. යම් පමණ වර ඔබ මෙයින් පානය කරන්නහු ද, එපමණ වර මා සිහි කිරීම පිණිස මෙය කරන්නැ'යි වදාළ සේක" (1 කොරෙන්ති 11:25).

## 5. ස්තුති කිරීමක්

"ඔවුන් වහන්සේ කුසලානක් ගනිමින්, **තුති පුද** "මෙය ගෙන ඔබ අතරෙහි බෙද ගන්න" (ලූක් 22:17).

"ඔවුන් වහන්සේ රොටී ගෙන **තුති පුද** ඒවා කඩා, ඔවුන්ට දී, ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේ ය. මා සිහි කිරීම පිණිස මෙය කරන්නැ'යි වදාළ සේක." (ලූක් 22:19)

## 6. පරිශ්‍රමණයක් (අත්දැකීමට ඇතුළුවීම) (සිහිකිරීමක්)

"ස්තුති කොට, කඩාඃ 'මෙය ඔබ උදෙසා දෙන මාගේ ශරීරය ය. මා **සිහිකිරීම** පිණිස මෙය කරන්නැ' යි වදාළ සේක (1 කොරින්ති 11:24).

දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පංගුකාර වන සියලු දෙනා ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වන්නේ ය. ක්‍රිස්තුස් වහන්සේ ද ඔවුන් තුළ සදහට ම ජීවත් වන සේක. එක ම ක්‍රිස්තුස් වහන්සේ ව ලබා ගන්නා අපි සියලු දෙනා එක ම ශරීරයක් වෙමු. එම එක ම ශරීරය ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය යි. එනම් ශුද්ධ වූ සභාව යි. එහෙයින් ඔවුන් වහන්සේ මෙන් කැඩෙන්නට, බිඳෙන්නට, වැය වෙන්නට සූදානම් විය යුත්තෙමු. පරාර්ථකාමී ව එකිනෙකාගේ යහපත සදහාත්, පොදු යහපත සදහාත්, ශුද්ධ වූ සභාවේ අභිවෘද්ධිය සදහාත් අවංක ව වෙහෙසීම හා වැයවීම අපගේ යුතුකම් වේ. ක්‍රිස්තුන් වහන්සේ අප සියල්ලන් වෙනුවෙන් පුද කළ ජීවිත යාගය ඉදිරියට ගෙන යාමට හවුල්කරුවන් විය යුත්තෙමු.

## දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම්

### 1. පූප කැඩීම

එවිට "ඔවුහු ද මග දී තමන්ට සිදු වූ කාරණා සහ **රොටී කැඩීමෙහි** දී ඔවුන්ට උන් වහන්සේ ප්‍රකාශ වූ හැටි ද පැවසූහ" (ලූක් 24:35).

"ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහි ද **රොටී කැඩීමෙහි** ද යාච්ඤාවෙහි ද නිරත ව කල් ගත කළහ (ක්‍රියා 2:42).

### 2. ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය

"ඔබ සභාවක් වශයෙන් එක්රැස් වන විට, **සමිඳාණන් වහන්සේගේ රාත්‍රි භෝජනය** වැළඳීමක් සිදු නොවේ (1 කොරින්ති 11:20).

### 3. නව පාස්කු මංගල්‍යය

"එබැවින් පරණ මුහුන්වලින් වත් ඊර්ෂ්‍යාව සහ දුෂ්ටකම නමැති මුහුන්වලින් වත් නොව අවංකකම ද සත්‍යය ද නමැති නුමුහුන් රොටියෙන් **පාස්කු මංගල්‍යය** පවත්වමු" (1 කොරින්ති 5:8).

### 4. ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගිකම

"අප ආසිරි කුසලාන ගෙන ආශිර්වාද කරන විට ඉන් අදහස් වන්නේ **ක්‍රිස්තුන් වහන්සේගේ** රුධිරයේ **සහභාගිකම** නොවේ ද? අප රොටි කඩන විට ඉන් අදහස් වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ **ශරීරයේ සහභාගිකම** නොවේ ද?" (1 කොරින්ති 10:16)

## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු

### ⋆ මෙල්කිසදෙක්ගේ යාගය

සාලොම් (ජෙරුසලම්) නුවර පූජක රජතුමකු වූ මෙල්කිසදෙක් ප්‍රථම වරට පූප හා මිදියුස ගෙන, දෙවියන් වහන්සේට ඔප්පු කළේ ය (උත්පත්ති 14:18-20).

### ⋆ මන්නා භෝජනය

ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මිදී, පොරොන්දු දේශය බලා යන ගමනේ දී දෙවියන් වහන්සේ මන්නා භෝජනයෙන් ඔවුන් පෝෂණය කළ සේක (නික්මයාම 16).

★ **නුමුහුන් පූප අනුභවය හා කුසලානයෙන් පානය කිරීම**

ඊජිප්තුවේ වහල්කමින් මිදී නික්ම යන රාත්‍රියේ කඩිනමින් පිටත් වූ බව සිහිකරනු වස් අවුරුදු පතා පාස්කු භෝජනය පැවැත්වීමේ දී ඉශ්‍රායෙල් ජනතාව විසින් නුමුහුන් පූප අනුභව කරන ලදි; කුසලානයෙන් පානය කරන ලදි (නික්මයාම 12:15-20).

★ **පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යය**

සුබාරංචි කතුවරුන් හතර දෙනා ම වාර්තා කරන එක ම ප්‍රාතිහාර්යය යි (මතෙව් 14:15-21, මාක් 6:35-44, ලූක් 9:12-17, ජොහන් 6:5-13). දිව්‍ය පූජා පිළිවෙතෙහි මෙහි දක්නට ඇති මූලික ලක්ෂණ මෙහි දැකිය හැකි ය. "ජේසුස් වහන්සේ **රොටී ගෙන, තුති පුදා, එය කඩා, බෙදා දුන් සේක."**

## ජීවනදායක භෝජනය පිළිබඳ ඉගැන්වීම්

"ජීවනදායක භෝජනය මම ය, මා වෙත පැමිණෙන යමෙක් වේ ද ඔහුට සාගිනි නොවන්නේ ය. මා අදහන යමෙක් වේ ද ඔහුට කිසි කලෙකත් පිපාස නොවන්නේ ය (ජොහන් 6:35).

දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය වළඳන අපි ක්‍රිස්තුන් වහන්සේ එහි ජීවමාන ව වැඩ සිටින බව පිළිගනිමු. උන් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමාන ව වැඩ සිටීම පිළිබඳ ව ඉතාලියේ ලන්චියානෝ නුවර සිදු වූ ප්‍රාතිහාර්යය කදිම නිදසුනකි.

# ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්යය



12.2 රූපය - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

ක්‍රි.ව. 800 දී පමණ ඉතාලියේ ලන්චියානෝ නුවර ශුද්ධ වූ ලෙගොන්ෂියන් මුනිතුමාට කැප කරන ලද කුඩා දෙව් මැදුරේ සේවය කළ එක්තරා තාපස පියතුමෙක් දිව්‍ය පූජාව පවත්වන විට, පූප හා මිදියුස ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හැරෙන්නේ ද'යි සැක කළේ ය. දිනක් එතුමා දිව්‍ය පූජාවේ දිව්‍ය රහස් කරන මොහොතේ පූපය මස් කැබැල්ලක් බවටත් මිදියුස රුධිරය බවටත් පත්වන බව දිටී ය. එම මස් කැබැල්ල හා රුධිරය ලන්චියානෝ නුවර විශේෂ දිව්‍ය සත්ප්‍රසාද කරඬුවක තැන්පත් කර ඇත.

1574 හා 1970 දි මෙම මස් කැබැල්ල හා රුධිරය පිළිබඳ ව විද්‍යාත්මක පර්යේෂණ සිදු කරන ලදි. මෙහි දී අනාවරණය වී ඇත්තේ එම මස් කැබැල්ල මිනිස් හදවතකින් ගත් එකක් බවත් රුධිරය "AB පොසිටිව්" රුධිර වර්ගයට අයත් වූ බවත් ය. ශතවර්ෂ 12කට



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

අධික කාලයක් පරිසර සාධකවලට නිරාවරණය වී පැවතුණ ද මෙම මස් කැබැල්ල හා රුධිරය නරක් වී නොමැති බවත් ය. තවද ශරීරයෙන් ඉවතට ගත් විට රුධිරයේ ප්‍රෝටීන් හා ඛණිජ පවතින්නේ ටික වේලාවකට පමණක් වන නමුදු මෙම රුධිරයේ ඇති ප්‍රෝටීන් හා ඛණිජ ඉවත් නොවී දිගටම පවතී.

1978 වර්ෂයේ දී නාසා ආයතනය ටියුරින් නුවර ශ්‍රී සළුව පිළිබඳ පර්යේෂණයක් සිදු කළේ ය. එහි දී අනාවරණය වූයේ ශ්‍රී සළුවේ තැන්පත් ව ඇති ලේ වර්ගය "AB පොසිටිව්" බව ය. ටියුරින් නුවර ශ්‍රී සළුවේත්, මස් කැබැල්ලේත් එක ම ලේ වර්ගයක් තිබීම වැදගත් අනාවරණයකි.

දිව්‍ය පූජාවට නිසි ලෙස හා උනන්දුවෙන් සහභාගි වීම කිතුනු අපගේ යුතුකමකි. හැකි සෑම විට ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගෙන ජීවමාන ක්‍රිස්තුන් වහන්සේගෙන් පෝෂණය විය යුතු වන්නෙමු. මෙම ආධ්‍යාත්මික පෝෂණය ස්වර්ග රාජ්‍යය කරා යන ගමනට මහෝපකාරී වේ. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමකර හෝ තැන්පත් කර ඇති විට පෞද්ගලික ව හෝ සාමූහික ව යාච්ඤා කිරීම මගින් දේව සබඳතාව වර්ධනය කර ගනිමු. එමෙන් ම දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තැන්පත් කර ඇති විට දණ නමස්කාර කළ යුතු වෙමු. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර ඇති විට දෙදණ නමා නමස්කාර කළ යුතු වෙමු.

## ක්‍රියාකාරකම

1. කතෝලික ජනවන්දනාව තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට වැදගත් තැනක් හිමි වන්නේ ඇයි?
2. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ **හතරක්** දක්වන්න.
3. දිව්‍ය සත්ප්‍රසාදී භෝජනයට පංගුකාර වන්නකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග **හතරක්** දක්වන්න.
4. දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ භාවිත වන නම් **හතරක්** දක්වන්න.
5. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු **හතරක්** නම් කරන්න.



*ජීවිතය සඳහා*

*දිව්‍ය පූජාවට නිසි ලෙස සහභාගි වීමටත්, පාප ක්‍ෂමාව ලබා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමටත් පුරුදු පුහුණු වෙමු.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.